# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2306/86 – 2022 නොවැම්බර් 19 වැනි සෙනසුරාදා – 2022.11.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2021/32.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශවයක් වශයෙන්,*

එන්. ඕ. ඩී. ජී. එස්. පීරිස් මයා, අංක 8/28, බුද්ධාලෝක මාවත, සුවාරපොළ, පිළියන්දල.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

මැක්රෝටෙක් හෙවි එන්ජිනියරින්, අංක 122/4, යාගොඩමුල්ල, කොටුගොඩ.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී

ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බටුවත්ත, නාරංගොඩ පාළුව, අංක 501, නීතිඥ පාලිත සේනාධීර මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 නොවැම්බර් මස 14 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2021/32.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

එන්. ඕ. ඩී. ජී. එස්. පීරිස් මයා, අංක 8/28, බුද්ධාලෝක මාවත, සුවාරපොළ, පිළියන්දල.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

මැක්රෝටෙක් හෙවි එන්ජිනියරින්, අංක 122/4, යාගොඩමුල්ල, කොටුගොඩ.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''එන්. ඕ. ඩී. ජී. එස්. පීරිස් මහතාට ලබාදෙන ලද නිල වාහනය හා ඉන්ධන දීමනාව අහිමි කිරීමෙන් අසාධාරණයක් සිදුවී තිබේ ද? යන්නත්, එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේ ද? යන්නත් පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 නොවැම්බර් මස 08 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 11 - 0222

මගේ අංකය: IR/COM/03/2021/103.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශවයක් වශයෙන්,*

කේ. ඒ. පියසිරි මයා, පේරගහ කොරටුව, වල්ගම, මාතර

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, අංක 19, පහළ ඩික්සන් පාර, ගාල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ජා-ඇල, වැලිගම්පිටිය, කොළඹ පාර, අංක 281, නීතිඥ අමල් ඒ. රන්දෙනිය මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

මනූෂ නානායක්කාර,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 නොවැම්බර් මස 14 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2021/103.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

කේ. ඒ. පියසිරි මයා, පේරගහ කොරටුව, වල්ගම, මාතර

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, අංක 19, පහළ ඩික්සන් පාර, ගාල්ල.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''කේ. ඒ. පියසිරි මහතා වසර 12 කට ආසන්න කාලයක් අඛණ්ඩව භුක්ති විඳි තනතුර හා වැටුප අහිමි කිරීම මගින් ඔහුට අසාධාරණයක් සිදුවී තිබේ ද? එසේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 නොවැම්බර් මස 03 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 11 - 0223

---

මගේ අංකය: IR/COM/01/2016/151.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2021.11.19 වැනි දින අංක 2254/48 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.11.10 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. කාන්ති කළුආරච්චි මෙනෙවිය, අංක 62/25, කටුකුරුන්ද වත්ත, මාවරමණ්ඩිය, කඩවත.
2. සුනිල් රත්නසිරි මයා, අංක 22/14, අරලිය උයන, දෙපානම, පන්නිපිටිය.
3. ටයිටස් පෙරේරා මයා, අංක 76/1 බී, ශ්‍රී ධර්මාරාම පාර, රත්මලාන.
4. ඊ. ඩී. කුමුදිනී මිය, අංක 493, කටුකුරුඳුවත්ත, ගල්කිස්ස.
5. ඩී. එම්. ජයවීර මයා, අංක 93/6, මීගහවත්ත පාර, දෙල්ගොඩ.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01.

අතර පවත්නා 2021.11.09 වැනි දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් රවීන්ද්‍ර ලාල් ගුණවර්ධන මහතා වෙත යොමු කරන ලදී.

බේරුම්කරු රවීන්ද්‍ර ලාල් ගුණවර්ධන මහතා එම නඩුවෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2021.11.10 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 31 වැනි දින,
කොළඹ දී ය.

EOG 11 - 0224/1

---

මගේ අංකය: IR/COM/01/2016/151.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**
4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව—

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. කාන්ති කළුආරච්චි මෙනෙවිය, අංක 62/25, කටුකුරුන්ද වත්ත, මාවරමණ්ඩිය, කඩවත.
2. සුනිල් රත්නසිරි මයා, අංක 22/14, අරලිය උයන, දෙපානම, පන්නිපිටිය.
3. ටයිටස් පෙරේරා මයා, අංක 76/1 බී, ශ්‍රී ධර්මාරාම පාර, රත්මලාන.
4. ඊ. ඩී. කුමුදිනී මිය, අංක 493, කටුකුරුඳුවත්ත, ගල්කිස්ස.
5. ඩී. එම්. ජයවීර මයා, අංක 93/6, මීගහවත්ත පාර, දෙල්ගොඩ.

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, මීහිඳුපුර, දම්මෝදය මාවත, අංක 13/1127, සරත් චන්ද්‍රසිරි විතාන මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 31 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2016/151.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. කාන්ති කළුආරච්චි මෙනෙවිය, අංක 62/25, කටුකුරුන්ද වත්ත, මාවරමණ්ඩිය, කඩවත.
2. සුනිල් රත්නසිරි මයා, අංක 22/14, අරලිය උයන, දෙපානම, පන්නිපිටිය.
3. ටයිටස් පෙරේරා මයා, අංක 76/1 බී, ශ්‍රී ධර්මාරාම පාර, රත්මලාන.
4. ඊ. ඩී. කුමුදිනී මිය, අංක 493, කටුකුරුඳුවත්ත, ගල්කිස්ස.
5. ඩී. එම්. ජයවීර මයා, අංක 93/6, මීගහවත්ත පාර, දෙල්ගොඩ.

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''ඉහත නම් සඳහන් සේවකයින් පස්දෙනා හට විධායක II ශ්‍රේණියේ කළමනාකරු (මුදල්) තනතුරෙහි සිට විධායක I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මුදල්) තනතුර දක්වා උසස්වීමේ අවස්ථාව අහිමි කිරීම මගින් එකී සේවකයන්ට යම් අසාධාරණයක් සිදු වූයේද? යන්න හා එසේ අසාධාරණයක් සිදුවූයේ නම් ඔවුන් එකිනෙකාට ලැබිය යුතු සහනයන් මොනාවා ද? යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ඔක්තෝබර් මස 21 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 11 - 0224/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.